සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/MF/05/02/08/පොදු

ඔබේ අංකය / உமது இல / Your No: ..........................................

දිනය / திகதி / Date: 2016/10/20

සියළුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමනාකරුවන් වෙත,

**දිවිනැගුම ප්‍රජාමූල බැංකු මඟින් සුහදශීලී මහජන සේවාවක් ලබාදීම හා බැංකු පරිශ්‍රයන් අලංකාරව තබාගැනීම සම්බන්ධව.**

ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත වී ඇති දිවිනැගුම ප්‍රජාමූල බැංකු මඟින් ක්ෂුද්‍ර මූල්‍යකරණ පහසුකම ඇතුළු අනිකුත් සේවාවන් අඩු ආදායම්ලාභීන් වෙත ලබාදීම සිදුකරන අතර, එම සේවාවන් ලබාදීමේ දී සුහදශීලී හා ගෞරවාන්විත සේවාවක් ඉලක්ක ගත පිරිස් වෙත ලබාදීමට බැංකු කළමනාකරුවන් ඇතුළු කාර්යය මණ්ඩලය ඉටා ගත යුතුය. මේ සම්බන්ධ සොයා බලා මහජන සේවය නිසිපරිදි සිදුවන බවටත්, යම් ගැටළු සහගත තත්ත්වයක් ඇති වන විටක ඒ සඳහා අවශ්‍ය පිළියම් යෙදීමට බැංකු කළමනාකරුවන්ට වගකීම පවරන අතර, මෙම උපදෙස් වලට අනුව කටයුතු නොකරන බැංකු කළමනාකරුවන් ඇතුළු කාර්යය මණ්ඩලය සම්බන්ධ දැඩි තීන්දුවක් ගැනීමට සිදුවන බවටත් අවධාරණය කරමු.

දිවිනැගුම ප්‍රජාමූල බැංකු වල අභ්‍යන්තර හා බාහිර පිරිසිදුතාව හා අලංකාරය ගැන සෑහීමකට පත්විය නොහැක. එබැවින් දිවිනැගුම ප්‍රජාමූල බැංකු වල පවිත්‍රතාවය හා අලංකාරය ඇති කිරීමට කඩිනමින් පහත පියවර ගත යුතුය.

01. බැංකු ගොඩනැගිලි අභ්‍යන්තර හා බාහිර පිරිසිදුව තබාගැනීම හා බැංකු පරිශ්‍රය අලංකාර කිරීම.
02. භාවිතා කරන ලද, කල් ඉකුත් වූ, විනාශ වූ ලිපිද්‍රව්‍ය ඉවත් කිරීම හෝ විනාශ කර දැමීම.
03. නැවත අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත නොහැකි කාර්යාල උපකරණ ඇතුළු අබිලි ද්‍රව්‍ය ඉවත් කිරීම (2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සඳහා වූ අංක DDD/HO/MF/ACC/23/තොග සමීක්ෂණ චක්‍රලේඛයේ උපදෙස් අනුව)
04. දිවිනැගුම බැංකු පරිශ්‍රයේ මල් පැල හා විසිතුරු ගස් වවා වඩාත් අලංකාර බිමක් ලෙස සකස් කිරීම හා නඩත්තු කිරීම.
05. බැංකු පරිශ්‍රය ඉදිරිපස අලංකාරය හා සෙවන සඳහා ඇසල ගසක් රෝපණය කිරීම හා නඩත්තු කිරීමට කටයුතු කිරීම. (ඉඩකඩ ඇති බිම් වල පමණක්)

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
011-2883802/2872202
Fax -011-2887280
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General
011-2871672
Fax -011-2887280
adg@divineguma.gov.lk
anuradhakum@yahoo.com

අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration)
011-2873799
Fax -011-2873996
diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

කාර්යාලය / அலுவலகம் / Office
011-2872202
**011- 2887722**(Hotline)
**Desktop - Ruvini**

2015 වර්ෂයේ, බොහෝමයක් දිවිනැගුම ප්‍රජාමූල බැංකු වල අලාභදායී තත්ත්වයක් පෙන්නුම් කර ඇත. එම තත්ත්වයෙන් මිදී, මූල්‍ය තිරසාරභාවය සහිත බැංකුවක් බවට ඔබ බැංකුව පත්කර ගැනීමට කටයුතු කල යුතුය. ඒ සඳහා දිවිනැගුම ප්‍රජාමූල බැංකු මඟින් ලබාදෙන ක්ෂුද්‍ර මූල්‍යකරණ පහසුකම සියළුම බැංකු සාමාජිකයින් වෙත ළඟාකරලීමටත් එමඟින් ඔවුන්ගේ ජීවනෝපාය සංවර්ධනය ඇති කිරීමට කටයුතු කල යුතුය. අවසානයේ දී, දිවිනැගුම ප්‍රජාමූල බැංකු වල ආදායම ඉහළ නැංවෙන අතර, එතුලින් ලාභදායී බැංකු ඒකකයක් බවට පත් කර ගත හැක.

තවද, විශේෂයෙන් දිවිනැගුම බැංකු හා ක්ෂේත්‍ර කාර්යය මණ්ඩල රාජකාරී කාලසීමාව තුල සුදුසු ඇඳුමකින් සැරසිය යුතු අතර, එමඟින් අප වෙත සේවාවන් ලබාගැනීමට පැමිණෙන ඉලක්කගත ජනතාවගේ ගෞරවය ලබාගැනීමටත්, රාජ්‍ය සේවයේ අභිමානය රැකගැනිමට හැකි බවත් මතක් කර සිටිමු.

මේ සම්බන්ධ දිවිනැගුම බැංකු කළමනාකරුවන් දැඩි අවබෝධයෙන් කටයුතු කල යුතු අතර, ඒ සඳහා සැලසුමක් සකස් කර දියත් කර ගැනීමට කටයුතු කල යුතුය.

**නීල් හපුහින්න.**

**අධ්‍යක්ෂ ජනරාල්,**

**පිටපත :-**

| | | | |
|---|---|---|---|
| 01. | ලේකම්,සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | - | කා.දැ.ස. |
| 02. | සියළුම දිස්ත්‍රික් දිවිනැගුම ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | කා.දැ.ස. |
| 03. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | කා.දැ.ස. |
| 04. | දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | දැ.ස. හා අ.ක.ස. |
| 05. | ප්‍රධාන අභ්‍යන්තර විගණක,දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව | - | අ.ක.ස. |
| 06. | සියළුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරුවන් | - | දැ.ස. හා අ.ක.ස. |